# තනතුරු ඇබෑර්තු

## අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

### ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි - ඛණ්ඩ 2
### ප්‍රජා විශෝධන නිලධාරි තනතුරේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම (විවෘත) – 2025

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රජා විශෝධන නිලධාරි II ශ්‍රේණියේ තනතුරෙ හි (ඌව, උතුරු මැද, උතුර, මධ්‍යම, වයඹ හා නැගෙනහිර කර්යාල තුළ) පවතින පුරප්පාඩු 08ක් සඳහා සුදුස්සන් තෝරාගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා දෙන ලකුණු මත තෝරාගනු ලබයි.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 දින දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, 2012.08.30 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත ඛණ්ඩ 2 සේවා ගණයේ ප්‍රජා විශෝධන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු තනතුරෙ හි II ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

2.2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන් හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

2.3 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුශංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

2.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.6 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

2.7 සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර, තෝරාගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක (05) අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

03. *වැටුප් පරිමාණය* :
2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය,

**රු. 58,660 - 10x1,190 - 11x1,360 - 15x1,670 - රු.110,570/- (MN 5-2025) වේ.**

එමෙන් ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :

4.1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අපරාධ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය /සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය / මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය / සමාජ වැඩ පිළිබඳ වසර හතරකට (04) නොඅඩු විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

නීතිය පිළිබඳ උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

4.2 පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

4.3 වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

4.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4.5 අනෙක් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ විය යුතු ය.

05. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

5.1 සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය :

| | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : රජයේ පිළිගත් ආයතනයකින්, | | 25 |
| | I. සමාජ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | II. වෙනත් පශ්චාත් උපාධි | 20 | |
| | III. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා | 15 | |
| | IV. ඩිප්ලෝමා පාඨමාලා (වසරකට වැඩි) | 10 | |
| | V. ඩිප්ලෝමා පාඨමාලා (මාස 09ට වැඩි) | 05 | |
| | (ලබාගත් ඉහළම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |
| 02. | අතිරේක වෘත්තීය සුදුසුකම්: රජයේ පිළිගත් ආයතනයකින්, | 10 | 10 |
| | I. මත් නිවාරණය/ සමාජ වැඩ/ උපදේශනය/ විශෝධනය හෝ අපරාධ විද්‍යාව පිළිබඳ ලබා ඇති ඩිප්ලෝමා (එකකට ලකුණු 05) | | |
| | II. සමාජ වැඩ/ මත් නිවාරණය/ උපදේශනය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලා - දින 07ට නොඅඩු (එකකට ලකුණු 03) | | |
| | III. සමාජ වැඩ/ මත් නිවාරණය/ උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා - දින 07ට නොඅඩු (එකකට ලකුණු 02) | | |
| | (එක් විෂයක් සඳහා ලබාගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.) | | |
| 03. | භාෂා හැකියාව : | | 15 |
| | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් මවුබස හැර වෙනත් භාෂාවකින් උපාධිය හදාරා තිබීම | 15 | |
| | II. ඉංග්‍රීසි/ දෙමළ/ සිංහල/ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (මවුභාෂාව හැර එක් භාෂාවකට ලකුණු 10, භාෂාවන් දෙකකට ලකුණු 15) | 15 | |
| | III. ඉංග්‍රීසි/ දෙමළ/ සිංහල සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මවුභාෂාව හැර එක් භාෂාවකට ලකුණු 05 බැගින්, භාෂාවන් දෙකකට ලකුණු 10) | 10 | |
| | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
| 04. | අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද : (පුනරුත්ථාපනය/ පරිවාස/ සමාජ සුභසාධනය/ උපදේශනය/ නීතිය/ ප්‍රජාපාදක විශෝධන ක්ෂේත්‍රයන් හි පළපුරුද්ද (පිළිගත හැකි ලේඛන මගින් තහවුරු කළ යුතුය) | | 30 |
| | I. වසර 05 හෝ ඊට වැඩි නම් | 30 | |
| | II. වසර 04 හෝ ඊට වැඩි නම් | 25 | |
| | III. වසර 03 හෝ ඊට වැඩි නම් | 20 | |
| | IV. වසර 02 හෝ ඊට වැඩි නම් | 15 | |
| | V. වසර 01 හෝ ඊට වැඩි නම් | 10 | |
| | VI. මාස 06 හෝ ඊට වැඩි නම් | 05 | |
| 05. | පරිගණක හැකියාව : රජයේ පිළිගත් ආයතනයකින්, | | 15 |
| | I. මාස 12ට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම | 15 | |
| | II. මාස 12ට නොවැඩි හෝ මාස 06 නොඅඩු පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම | 10 | |
| | III. මාස 03ට නොඅඩු හා මාස 06ට නොවැඩි පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම | 05 | |
| | IV. වෙනත් පරිගණක සහතික සඳහා (මාස 01ට නොඅඩු හා මාස 03ට නොවැඩි) | 03 | |
| 06. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය : | 05 | 05 |
| | එකතුව | | 100 |

06. **අයදුම් කිරීමේ ක්‍රමය** :
අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව විය යුතු අතර සෙ.මී. 22 - 29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු වේ. අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රය ලැබුණු බව දන්වනු නොලැබේ.

07. **අයදුම්පත් යොමු කිරීම**

7.1 මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2025.06.06 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපැලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

කොමසාරිස්,<br>
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව,<br>
15 වන මහල,<br>
මෙහෙවර පියෙස,<br>
නාරාහේන්පිට,<br>
කොළඹ-05.

7.2 අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.06.06 දින** වේ. එම දිනට අදාළ සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3 දැනට රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/ සිවිල් ආයතන) නියුතු නිලධාරින්ගේ අයදුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

7.4 අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "ප්‍රජා විශෝධන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

08. **සැළකිය යුතුය** :

I. සහතිකපත්වල මුල් පිටපත් ඉල්ලූ විටක දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

II. අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධ නිකුත් කර ඇති චක්‍රලේඛ හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හී කොන්දේසි මෙම තනතුරු සඳහා අදාළ වේ.

(මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.)

දිලාන් ගුණරත්න,<br>
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්.

2025 මැයි මස 15 වැනි දින.